# 2025 නොවැම්බර් මස මාසික සභා රැස්වීම වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම ශාලාව
දිනය - 2025.11.21
වේලාව - පෙ.ව. 10.00
පැමිණීම

| | නම | | තනතුර |
|---|---|---|---|
| I. | එච්.එල්.ජයසිරි | - | ගරු සභාපති |
| II. | ආර්.රජිත් ප්‍රියදර්ශන | - | ගරු උපසභාපති |
| III. | එම්.එල්.එම්.හනීෆා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IV. | කේ.රත්න | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| V. | එම්.ජී.ආරියසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VI. | එන්.වී.චමින්ද ජයනාත් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VII. | පී.එම්.පී.අනුර ප්‍රියන්ත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VIII. | එම්.එල්.එම්.අසාර් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IX. | බී.කේ.නිලූකා කුමුදුනී | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| X. | ආර්.ඩබ්ලිව්.සිරිසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XI. | කේ.පී.තමිලා දිල්රුක්ෂි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XII. | සුදත් චමින්ද උයනහේවා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIII. | බී.ඩී.නිපුන ගයාශාන් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIV. | එස්.දයාසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XV. | එල්.වයි.නුවන් චතුරංග | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVI. | ජේ.ජී.තනුජා දිලානි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVII. | උදානි ලියනගේ | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVIII. | එල්.ජී.සුනිල් පියංකර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIX. | එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

නොපැමිණීම :- ---

| | නම | | තනතුර |
|---|---|---|---|
| XX. | හර්ෂ උදයකුමාර ජයවීර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XXI. | ආර්.කේ.එම්.රෝහිත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XXII. | ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණී | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව පෙ.ව.10.00 පමණ ,ගරු සභාපති , එච්.එල්.ජයසිරි මහතා විසින් 2025 වර්ෂයේ නොවැම්බර් මස මාසික සභාව පැවැත්වෙන අද දින පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්,ලේකම්තුමිය ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.



CamScanner

(අ) 2025.10.24 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

2025.10.24 වන දිනැති මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන බව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා යෝජනා කළ අතර,එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදී.

(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේ ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කුසලතා සම්මානය දිනාගෙන ඇති බවත් ඒ වෙනුවෙන් විශාල කැපකිරීමක් සිදු කරන ලද ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලය සඳහා විශේෂ ස්තුතිය පුදකරන ලදි.

(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන -නැත
(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත
(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.

- ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා

- මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනා

1. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථානවල පිහිටි කඩ කාමර වල බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථානවල පිහිටි කඩ කාමර වල බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ස්ථානය | අංකය | දැනට බදු අයිතිය හිමි අයගේ නම | පැවරීම | සම්බන්ධය |
|---|---|---|---|---|---|
| 01 | තිස්සමහාරාම පොදු වෙළඳපොළ | 108 | ජේ.ජේ.ප්‍රියන්ත | ජේ.ඩබ්.චමිල් නිශාන්ත | එක්වන් මුදල් අය කර |
| 02 | තිස්සමහාරාම පූජා නගර රථ වාහන නැවතුම්පොළ 2 පියවර කඩ කාමර | 02 | ජේ.ජී.ජිනසේන | ඩබ්.ජේ.ශාන්ති | එක්වන් මුදල් අය කර |
| 03 | තිස්සමහාරාම පූජා නගර මල්කඩ | 04 | එම්.එච්.සිරියලතා | ආර්.එම්.රවීන්ද්‍ර මධුෂංක | මවගෙන් පුතාට |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

2. 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාව සතු දේපළ වලට අදාළ ස්ථාවර වත්කම් සමීක්ෂණය සිදු කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලය පත් කිරීමේ යෝජනාව

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාව සතු දේපළ වලට අදාළ ස්ථාවර වත්කම් සමීක්ෂණය සිදු කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලය පත් කර දෙන ලෙස ඉල්ලා විෂය නිළධාරි විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදි.ඒ අනුව ඒ සඳහා පහත නම් සඳහන් අයගෙන් සැදුමලත් කමිටුවක් පත් කිරීමට 2025.11.10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී තීරණය වූ අතර 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් අයගෙන්



CamScanner

සැදුම්ලත් ස්ථාවර වත්කම් සමීක්ෂණ කමිටුව ලෙස පත් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

I. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා
II. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.පී. සුජීවා නිල්මිණී මහත්මිය
III. සංවර්ධන නිළධාරි ඒ.එම්.ගීතාංජලි ධනුෂ්කා මහත්මිය
IV. තාක්ෂණ සේවා නිළධාරි එම්.ඩබ්.පී.චතුරිකා මෙනවිය
V. කළමණාකරණ සේවා නිළධාරි එච්.වයි.උදිනා ප්‍රියදර්ශනී මහත්මිය
VI. පරිගණක ක්‍රියාකරු එල්.වයි.සුමංගලා සුබෝධිනි මහත්මිය

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

3. <u>තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවට අයත් තිස්සමහාරාම පැරණි බස් නැවතුම්පොළ නව කඩ කාමරයන්හි එක්වන් මුදල් ගෙවීම සඳහා වසරක සහන කාලයක් ලබාදීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවට අයත් තිස්සමහාරාම පැරණි බස් නැවතුම්පොළ නව කඩ කාමර අංක 03 හි බදු අයිතිකරු වන අයි.පී.ප්‍රේමලාල් මහතා එක්වන් මුදල් ගෙවීම සඳහා වසරක සහන කාලයක් ඉල්ලා එවන ලද ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදි.කඩ කාමර වල බදු අයිතිය පැවරීම සම්බන්ධයෙන් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර ඇති 2010/01 චක්‍රලේඛය ප්‍රකාරව එක්වන් මුදල් ගෙවීම සඳහා ලබාදිය හැක්කේ මාස හයක කාලයක් වන බැවින් එම සහන කාලය ලබාදීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

4. <u>තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවේ කාර්යයන් සඳහා දරන ලද රු.100,000.00 වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීම සඳහා වූ යෝජනාව</u>

2025-10-07 දිනති පැවති මුදල් කමිටු සඳහා ඉදිරිපත් කරන ලද රු.100,000.00 ට වැඩි ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ආයතනය | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 01 | ලේකම්(ති.ප්‍රා.ස) | යාන්ත්‍රික වැඩපල සඳහා පිටතින් ලබා ගත් සේවකයින් දෙදෙනා සඳහා ගෙවීම (25.10.01 සිට 25.10.31 දක්වා) | 139,150.00 |
| 02 | බී.ආර්.රේණුකා | 2025 වර්ෂය සඳහා සෞඛ්‍ය කම්කරු සේවකයන් සඳහා නිල ඇඳුම් ලබා දීම | 196,650.00 |
| 03 | ලේකම්(ති.ප්‍රා.ස) | සේවා අවශ්‍යතාව මත සේවය ලබා ගත් කම්කරුවන් සඳහා ඔක්තොම්බර් මාසයට අදාලව ගෙවීම් කිරීම | 558,900.00 |
| 04 | වයර්ලින්ක් ප්‍රයිවට් ලිමිටඩ් | ටයර්,ටියුබ්,රිම්ටේප්(සභාවේ රථ වාහන සඳහා)වෙනුවෙන් ගෙවීම | 161,620.00 |
| 05 | ඉරේෂා ෆිලිං සෙන්ටර් | ඉන්ධන බිල්පත් පියවීම | 369,339.00 |



CamScanner

| | | | |
|---|---|---|---|
| 06 | තිළිණ මෝටර්ස් | LO-3589 ජල බවුසරයේ අළුත්වැඩියා බිල්පත | 256,500.00 |
| 07 | තිළිණ මෝටර්ස් | 227-5807 ජල බවුසරයේ අළුත්වැඩියා බිල්පත | 162,000.00 |
| 08 | තිළිණ මෝටර්ස් | 56-1099 කැබ් රථය අළුත්වැඩියා බිල්පත | 476,500.00 |
| 09 | තිළිණ මෝටර්ස් | MG -330 මෝටර් ග්‍රේඩරය අළුත්වැඩියා බිල්පත | 240,500.00 |
| 10 | තිළිණ මෝටර්ස් | MG -330 මෝටර් ග්‍රේඩරය අළුත්වැඩියා බිල්පත | 256,200.00 |
| 11 | තිළිණ මෝටර්ස් | MG -330 මෝටර් ග්‍රේඩරය අළුත්වැඩියා බිල්පත | 227,050.00 |
| 12 | ඔටෝ බෙස් ආයතනය | ZB-0413 කම්පැක්ටරයේ අළුත්වැඩියා බිල්පත | 1,603,752.33 |
| 13 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | බවුසර් සැපයුම් සඳහා ජලය ලබා දීම වෙනුවෙන් 2025 සැප්තැම්බර් මස සඳහා බිල්පත් පියවීම | 145,140.00 |
| 14 | The Associated Newspapers Of Ceylon Limited | 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව පුවත්පත් දැන්වීම පළ කිරීම සඳහා ගෙවීම | 242,324.80 |
| ආවරණ අනුමැතිය යටතේ ගෙවීම් විස්තරය | | | |
| 15 | ඉරේෂා ෆිලිං සෙන්ටර් | ඉන්ධන බිල්පත් පියවීම | 461,712.50 |
| 16 | ඉරේෂා ෆිලිං සෙන්ටර් | ඉන්ධන බිල්පත් පියවීම | 492,698.00 |
| 17 | ඉරේෂා ෆිලිං සෙන්ටර් | ඉන්ධන බිල්පත් පියවීම | 585,753.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

5. <u>වීරවිල කාර්මික විද්‍යාලයේ කාර්මික ශිල්පී පාඨමාලාව හදාරන සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුවීම සඳහා මෝටර් වාහන කිහිපයක් ලබාදීම සඳහා වූ යෝජනාව</u>

වීරවිල කාර්මික විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් කාර්මික ශිල්පී පාඨමාලාව හදාරන සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුවීම සඳහා , වෙන්දේසි කිරීමට නියමිත මෝටර් වාහන කිහිපයක් අප වෙතින් ඉල්ලා ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුබවට මෙම ගරු සභාවට යෝජනා කරමි.(මෙ සම්බන්ධව අපහරණය කිරීමේ තක්සේරු මණ්ඩලය වෙතට යොමුකර ඇති අතර එම මණ්ඩල තීරණය අප වෙත ලැබී නොමැත.)

➢ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා</u>

වීරවිල කාර්මික විද්‍යාලයේ ඉගෙනුම ලබන්නේ තිස්සමහාරාම බල ප්‍රදේශයේ ම දරුවන් වන බැවින් අපහරණය කිරීමට වාහන කිහිපයක් ලබාදීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.



CamScanner

➢ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

අපහරණය කිරීමේ තක්සේරු මණ්ඩලයේ සහ පලාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාදීමෙන් පසුව මෙම වාහන වීරවිල කාර්මික විද්‍යාලයට ලබාදීම සුදුසුබවට ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

6. මහසෙන්පුර ආදාහනාගාරයේ නඩත්තු කටයුතු සඳහා ඇස්තමේන්තු මුදල් ගෙවීම කිරීම සඳහා වූ යෝජනාව

මහසෙන්පුර ආදාහනාගාරයේ නඩත්තු කටයුතු සඳහා ඇස්තමේන්තු මුදල වන රු.383,500.00ක මුදල ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට ගෙවීම කටයුතු කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

7. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු පූජා නගර රථවාහන නැවතුම්පල පොල් එලදාව සඳහා මාසික වාරික මුදල සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු පූජා නගර රථවාහන නැවතුම්පල පොල් එලදාවට අයත් පොල් ගස් (08) න් පොල් ගස් 02 ක් ගලවා ඉවත් කර ඇති බවට තාක්ෂණ සේවා නිළධාරී විසින් වාර්ථා කර ඇත. ඒ අනුව එම දේපල සඳහා 2025 වර්ෂයේ ඔක්තෝම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා වාරික මුදල් අඩු කර දෙන ලෙස බදු කරු වන පී.එම්.පී සමන් ප්‍රේමලාල් මහතා විසින් ඉල්ලීම සිදු කර ඇත අතර ඒ සඳහා 2025.11.10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ නිර්දේශය හිමිවිය. ඒ අනුව එම දේපලෙහි මාසික වාරික මුදල පහත පරිදි සංශෝධනය විය යුතු අතර එම වාරික මුදල අය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

මාසික වාරික මුදල $= \frac{1000.16}{8} = 125.02 \times 6 =$ රු - 750.12

සංශෝධිත වාරික මුදල = රු. 750.12 අය කිරීමට නියමිත මුදල

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.තමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා

දේශීය විදේශීය සංචාරකයින් සඳහා සියළු පහසුකම් සහිත වැසිකිළි පද්ධතියක් සකස්කිරීම සඳහා මෙම පොල් ගස් දෙක කපා ඉවත් කළ බව ප්‍රකාශ කරන ලදි.

(පෙ.ව 10.20 ට ගරු ප්‍රා දේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා සභාවට පැමිණෙන ලදි.)

8. 2026 වර්ෂයට අදාළව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු පූජා නගර රථවාහන නැවතුම්පල පොල් එලදාව සඳහා මාසික වාරික මුදල සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව

2026 වර්ෂයේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම් පල වැසිකිළි පද්ධතිය අලුතින් ඉදිකිරීමේදී ඒ අසල පිහිටා ඇති පූජා නගර රථවාහන නැවතුම්පල පොල් එලදාවට අයත් පොල් ගස් (08) න් පොල් ගස් 02 ක් ගලවා ඉවත් කර ඇති බවට තාක්ෂණ සේවා නිළධාරී විසින්ද වාර්ථා කර ඇත. මේ වන විට මෙම දේපල 2026 වර්ෂය සඳහා රු.12,120.00 ක මුදලකට බදු අයිතිය ලබා ගෙන ඇත.එබැවින් මෙම දේපලෙහි මාසික වාරික මුදල පහත පරිදි සංශෝධනය විය යුතු අතර ඒ සඳහා 2025.11.10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ



CamScanner

නිර්දේශය හිමිවිය. ඒ අනුව 2026 වර්ෂය තුළ දී මෙම දේපල වෙනුවෙන් සංශෝධනය වූ මාසික වාරික මුදල අය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

ටෙන්ඩර් වූ මුදල = 12120.00

අය කිරීමට නියමිත මුදල $= \frac{12120.00}{8} = 1515.00 \times 6 =$ රු - 9090.00

මාසික වාරික මුදල = රු. 757.50

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ <u>කාර්මික සේවා කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

9. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් ඉදිරියේ දී සිදු කිරීමට නියමිත ව්‍යාපෘතීන්ට අදාළව සකස් කරන ලද ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් ඉදිරියේ දී සිදු කිරීමට නියමිත පහත දක්වා ඇති ව්‍යාපෘතීන්ට අදාළව සකස් කරන ලද ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | අරමුදල් ප්‍රභවය | ඇස්තමේන්තු මුදල (රු) |
|---|---|---|---|
| 01 | කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ ගේට්ටුව සකස් කිරීම | සභා අරමුදල් | 181,129.58 |
| 02 | කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ දැන්වීම් පුවරු 02ක් සකස් කිරීම | සභා අරමුදල් | 67,250.70 |
| 03 | කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කුට්ටිගල් ඇතිරීම | සභා අරමුදල් | 487,575.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.කේ.නිලුකා කුමුදුනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ <u>පරිසර පොදු පහසුකම් කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

10. <u>තිස්ස නගරයෙහි කානු පද්ධතියේ කැඩී ඇති ස්ලැබ් කැලි සකස්කර කානු පද්ධතිය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය කොන්ත්‍රාත් ලබාදීම සඳහා වූ යෝජනාව</u>

තිස්ස නගරයෙහි කානු පද්ධතියේ කැඩී ඇති ස්ලැබ් කැලි සකස්කර කානු පද්ධතිය අලුත්වැඩියා කිරීම කෙරෙහි පරිසර කමිටුවේ අවධානය යොමු වූ අතර, කානු පරීක්ෂා කර බලා සුදුසු පරිදි කොන්ත්‍රාත් ලබාදී එම අලුත්වැඩියාවන් කඩිනමින් සිදු කිරීම සඳහා 2025.11.10 දින පැවති පරිසර පොදු පහසුකම් කාරක සභා නිර්දේශය හිමි වූ මෙම අලුත්වැඩියාවන් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

11. <u>බස් නැවතුම්පොලෙහි තැබීම සඳහා සිලින්ඩරාකාර මල් පොච්චි සකස් කිරීම සඳහා වූ යෝජනාව</u>

බස් නැවතුම්පොලෙහි තබා ඇති කුඩා මල් පෝච්චි ප්‍රමාණවත් නොවන බැවින් අඩි දෙකහමාර සිලින්ඩර සපයා එම මල් පැළ සිටුවීම කෙරෙහි පරිසර කමිටුවේ අවධානය යොමු වූ අතර, එම



CamScanner

සිලින්ඩර සකස් කිරීම සඳහා අවශ්‍ය අච්චුවක් මිලදී ගැනීමට හෝ කුලී පදනම මත ලබාගෙන එම සිලින්ඩරාකාර මල් පෝච්චි ප්‍රාදේශීය සභාව මගින් සකස් කිරීම සුදුසු බවත්, ඒවායෙහි නඩත්තු කටයුතු වෙළඳ සංගමය වෙත පැවරීම සුදුසු බවටත්, 2025.11.10 දින පැවති පරිසර පොදු පහසුකම් කාරක සභා නිර්දේශය හිමි බැවින් මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

> <u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

තිස්සමහාරාමය සංචාරක ආකර්ශන පුරවරයක් බවට පත් කිරීම සඳහා බස් නැවතුම්පොලෙහි මල් පෝච්චි තැබීම වඩා වැදගත්වන බවත් , සංචාරක ආකර්ශන පුරවරයක් බවට පත් කිරීමේ අරමුණින් බස් නැවතුම්පල්වල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ අනුමැතිය ලැබී ඇත්තේ තංගල්ල හා තිස්සමහාරාමය සඳහා පමණක් වන බවත් එම නිසා මෙය ඉතා වැදගත්වන බවත් ප්‍රකාශ කරන ලදි.

12. <u>අනවසර ලෙස කසල බැහැර කරනු ලබන ස්ථාන වල සීසීටීවී කැමරා පද්ධතියක් සකස් කිරීම සඳහා වූ යෝජනාව</u>

2025.08.21 දිනැති මහා සභාවේ යෝජනා අංක 29 යටතේ යෝජනා වූ පරිදි නගරයේ කසල බඳුන් තැබීම පිළිබඳව කමිටුවේ සාකච්ඡාවට ලක් වූ අතර එහිදී යම් යම් ස්ථානවල කසල බඳුන් තැබීම වෙනුවට ප්‍රාදේශීය සභාවේ කසල එකතු කිරීමේ රථය වෙත කසල ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. තව ද අනවසර ලෙස කසල බැහැර කරනු ලබන අලුත්ගොඩ පාර මාර ගස, තිස්ස නගරයෙහි ලොරිපාක් එක, දෙබරවැව පොළ භූමිය, සභාව ඉදිරිපිට සහ යෝධකණ්ඩිය මාර ගස යන ස්ථානයන්හි එලෙස කසල බැහැර කරන පුද්ගලයන් හඳුනාගැනීම සඳහා සීසීටීවී කැමරා පද්ධතියක් සකස් කිරීම සඳහා 2025.11.10 දින පැවති පරිසර පොදු පහසුකම් කාරක සභා නිර්දේශය හිමි බැවින් මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

> <u>නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

13. <u>වීථි පහන් කට්ටල මිල දී ගැනීම සඳහා වූ යෝජනාව</u>

2025.11.10 පැවති නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාවේ නිර්දේශය පරිදි තිස්සමහාරාම සභා බල ප්‍රාදේශයේ වන අලි ගැටළුව බහුලව පවතින කිරින්ද, රණකෙළිය, විහාරමහාදේවිපුර, රන්දුනුවත්ත, තිස්සපුර, විජයපුර, සාලියපුර, මාගම, අන්දරගස්යාය, ජුල්පල්ලම, කාවන්තිස්සපුර, උද්දකන්දර යන කොට්ඨාශ සඳහා සහ රාජ්‍ය ආයතන මගින් ලබා දෙන ඉල්ලීම් පරිදි වසමක් සඳහා කට්ටල 03 බැගින් වීථි පහන් කට්ටල 50 ක් මිලදී ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් වම්න්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

> <u>ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

14. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා සේවාව ලබා ගන්නා පුද්ගලයන් තවදුරටත් සේවයේ යෙදවීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින ප්‍රාථමික මට්ටමේ තනතුරු 16ක් සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනම මත 2025.12.31 දින දක්වා පුද්ගලයන් ලියාපදිංචි කර සේවය ලබා ගැනීම දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක 01/10/06-03-(හම42) හා 2025.07.21 දිනැති ලිපිය මගින් අනුමැතිය ලබා දී තිබුණි.නමුත් සභාව මගින් ඉටුකරනු ලබන කටයුතු සඳහා එලෙස සේවාව ලබා ගන්නා පුද්ගලයන් සේවයේ යෙදවීම තවදුරටත් අත්‍යවශ්‍ය වන බැවින් 2025.12.31 දිනෙන් පසුවද සේවාව ලබා ගත යුතුව ඇත. එබැවින් 2026.06.30 දින දක්වා ඔවුන්ගේ සේවය ලබා ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රත්න මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

15. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා වූ අය - වැය කෙටුම්පත සභාවට ඉදිරිපත් කිරීමේ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා වූ අය - වැය කෙටුම්පත මෙම ගරු සභාවට ඉදිරිපත් කරමි.

➢ <u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

2026 වර්ෂය සඳහා වූ අය - වැය කෙටුම්පත 2025.12.03 වන දින විවාදයට ගැනීම සුදුසුයි බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.විරේන්ද්‍ර විරාජ් මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව</u>

16. <u>ඇල්ලගල 32 ග්‍රාමසේවා වසමේ මීටර් 300 කාණු පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා වූ යෝජනාව</u>

ඇල්ලගල 32 ග්‍රාමසේවා වසමේ පැරණි සමූපකාර ගොඩනැගිල්ල අසල සිට ඇල්ලගල හන්දිය දක්වා ඇති නිවාස කිහිපය කුඩා වර්ෂාවකදී පවා ජලයෙන් යටවේ.මෙයට හේතුව වනුයේ මීටර් 300 පමණ වන කාණු පද්ධතිය යාවත්කාලීන නොකිරීමයි.ඉහත කරුණු සලකා බලා මෙම කාණුව සකසා ගැනීමට අවශ්‍ය කටයුතු සළසාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

➢ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.විරේන්ද්‍ර විරාජ් මහතා</u>

කාණු පද්ධතිය JCB යන්ත්‍රය යොදා සකස් කරදෙන මෙන් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ <u>වෙනත් යෝජනා</u>

➢ <u>ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

17. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් දෙබරවැව පොදු වෙළඳපොළ භූමියට විදුලි සම්බන්ධතාවයක් ලබාගැනීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් දෙබරවැව පොදු වෙළඳපොළ භූමියට දැනට ලබා ගෙන ඇති විදුලි සැපයුම පොළ පැවැත්වෙන දින වලට ප්‍රමාණවත් නොවීම නිසා පොළ දින වලට වරින් වර විදුලිය විසන්ධි වීම සිදු වේ.මේ සම්බන්ධයෙන් විදුලි බළ මණ්ඩලය ලවා පරීක්ෂා කර බැලූ අතර



CamScanner

වෙළෙන්දන් විසින් පරිභෝජනය කරන විදුලි ඒකක ප්‍රමාණයට පවතින ධාරිතාවය ප්‍රමාණවත් නොවන බවත් තවත් විදුලි සම්බන්ධතාවයක් හෝ තෙකලා විදුලි සම්බන්ධතාවයක් ලබා ගන්නා ලෙසත් පවසන ලදි.එබැවින් දෙබරවැව පොදු වෙළදපොළ සඳහා තවත් එකලා විදුලි සම්බන්ධතාවයක් හෝ පවතින විදුලි සම්බන්ධතාවය වෙනුවට තෙකලා විදුලි සම්බන්ධතාවයක් හෝ ලබා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

- ➢ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

මෙය බරපතල ගැටළුවක්ව පවතින බවත් එකලා විදුලි සම්බන්ධතාව හෝ තෙකලා විදුලි සම්බන්ධතාව යන දෙකෙන් වැඩි වාසිදායක ක්‍රමයට යොමු වීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

- ➢ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා

මේ සඳහා තෙකලා විදුලි සම්බන්ධතාව ලබා ගැනීම වඩාත් සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

- ➢ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනගේවා මහතා

මේ සඳහා තෙකලා විදුලි සම්බන්ධතාව ලබාගන්නේ නම් සූර්යය පැනල භාවිතයට ගත හැකි බව ප්‍රකාශ කරන ලදි.

- ➢ අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා

දෙබරවැව පොදු වෙළදපොළ භූමියට තෙකලා විදුලි සම්බන්ධතාව ලබා ගැනීම වඩාත් සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

18. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ රාජකාරි කටයුතු සඳහා අත්‍යාවශ්‍ය වන පහත සඳහන් යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ දෛනික රාජකාරි කටයුතු සඳහා අත්‍යාවශ්‍ය වන පහත සඳහන් යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- ❖ සභා කාර්යාලය සඳහා අත්‍යාවශ්‍ය වන විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම
- ❖ සභා කාර්යාලය සඳහා නව ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම
- ❖ සභා කාර්යාලය සඳහා නව වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම
- ❖ සභා කටයුතු සඳහා නව කැමරාවක් මිලදී ගැනීම
- ❖ රැස්වීම් සහ විවිධ උත්සව සඳහා භාවිතා කළ හැකි ශබ්ද විකාශන පද්ධතියක් මිලදී ගැනීම

- ➢ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා

මෙම යන්ත්‍ර හා උපකරණ අතරට මුදල් ගණනය කිරීමේ යන්ත්‍රයක් ද ඇතුළත් කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

- ➢ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

සභාවේ කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව සිදු කිරීම සඳහාත් අවධානම් තත්වයන් මගහරවා ගැනීම සඳහාත් , මුදල් ගනුදෙනු සිදුවන සරප් අංශයට මුදල් ගණනය කිරීමේ යන්ත්‍රයක් ලබාදීමට එකඟතාව ලබාදෙන බව ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

19. කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කසළ වළ ගොඩකිරීම සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව



CamScanner

කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කසළ වළ ගොඩකිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කර ඇති රු.1,610,000.00 වන ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| Estimate for Uddakandara composed land filling work | | | | | | |
|---|---|---|---|---|---|---|
| NO | ITEM NO. | DESCRIPTION | UNIT | QTY | RATE | AMOUNT |
| 1 | | Re-filling 1800 Cu.m (150x60x20 feet) sanitary land fill pit (Available soil) by 200 Excavator machine | Machine hours | 150 | 10,500.00 | 1,575,000.00 |
| 2 | | Excavator machine transport | PS | 1 | 35,000.00 | 35,000.00 |
| TOTAL | | | | | | 1,610,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

20. <u>තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව සතුරථවාහන සහ යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීමේදී හම්බන්තොට මහලේවායේ සහකාර යාන්ත්‍රික ඉංජිනේරු පී.මුතුමාල මහතාගේ සේවය ලබා ගැනීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව සතුරථවාහන සහ යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශ යටතේ අදාළ අලුත්වැඩියාවන් සිදු කළ යුතු වුව ද යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු සම්බන්ධ කර ගැනීම අපහසු වීම හේතුවෙන් රථවාහන නඩත්තු කටයුතු ප්‍රමාද වන අවස්ථා පවතී. මෙම තත්වය මගහරවා ගනිමින් අලුත්වැඩියාවන් කළ යුතු තත්වයේ පවතින රථවාහන සහ යන්ත්‍ර සූත්‍රපරීක්ෂා කර බලා අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා වූ නිර්දේශ ලබා ගැනීමට ලුණුගම්වෙහෙර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කලාප යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු එම්.එම්.උදයංග මහතාට අමතරව හම්බන්තොට මහලේවායේ සහකාර යාන්ත්‍රික ඉංජිනේරු පී.මුතුමාල මහතාගේ සේවය ලබා ගැනීම සුදුසු බවට මෙම සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

21. <u>සඳගිරිපුර ගල්මැදවව පාර පාලම පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුව සහ ව්‍යාපෘතිය සභා අරමුදලින් සිදු කිරීම සඳහා වූ යෝජනාව</u>

සඳගිරිපුර ගල්මැදවව පාර පාලම පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා රු.600,000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීමටත් මෙම ව්‍යාපෘතිය සභා අරමුදලින් සිදු කිරීමත් සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

22. <u>විකිරි උදානපුර සිට සුදුවැල්ලට යන මාර්ගයේ පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුව සහ ව්‍යාපෘතිය සභා අරමුදලින් සිදු කිරීම සඳහා වූ යෝජනාව</u>

විකිරි උදානපුර සිට සුදුවැල්ලට යන මාර්ගයේ පාලම ඉදිකිරීම සඳහා රු.2,500,000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීමටත් මෙම ව්‍යාපෘතිය සභා අරමුදලින් සිදු කිරීමත් සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

CamScanner

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

23. නැදිගම්විල ප්‍රජා ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ යෝජනා

නැදිගම්විල ප්‍රජා ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් සම්බන්ධයෙන් තාක්ෂණ සේවා නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය අනුමැතිය සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වැඩිදුර දැනුවත් වීම සඳහා ගරු මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතාගේ යෝජනාවෙන්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් පෙ.ව.10.50 ට ගරු මහ සභාව කාරක සභාවක් බවට පත්විය.
නැදිගම්විල ප්‍රජා ජල ව්‍යාපෘතිය අනුමත වූ අවස්ථාවේ දී ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ,වාරි මාර්ග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඇස්තමේන්තු සකස් කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව උපදෙස් ලබාගත් බවත් , නැදිගම්විල ප්‍රජා ජල ව්‍යාපෘතිය විසින් ඉල්ලීම සිදු කළේ මෙතෙක් කාලයක් ගං ඉවුරේ සකස්කරන ලද ළිං අසාර්ථක වූ බැවින් අළුතින් සකස් කරන ලද ළිඳ නිතරම වැඩි වතුර ප්‍රමාණයක් පවතින ගඟ මැද සකස් කරදෙන ලෙසයි.ඒ අනුව කිරිදි ඔය මැද කොන්ක්‍රීට් සිලින්ඩර යොදා ළිඳ සකස් කර එය වටා කළු ගල් ආරක්ෂක වැටියක් සහ ළිඳ ආවරණය වන සේ කොන්ක්‍රීට් වලින් සකස් කරන ලද පියනක් ද ගඟ පතුලේ සිට foot valve සහිත නළ පද්ධතිය මඟින් පොම්පාගාරය හරහා වැංකියට ජලය සැපයුම සකස් කිරීමය සැලසුම් කළ බවත් තාක්ෂණ සේවා නිලධාරි එල්.පී.ජගත් කුමාර මහතා විසින් ප්‍රකාශ කරන ලදි.මේ අනුව සකස් කරන ලද ඇස්තමේන්තු ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ,වාරි මාර්ග දෙපාර්තමේන්තුව වෙත යොමු කර එකඟතාව ලබාගෙන ඇස්තමේන්තු අනුමත කරගත් බවත් නිසි ටෙන්ඩර් පටිපාටියට අනුව ටෙන්ඩර් ලබාදීම සිදු කර ගිවිසුම්ගතව ඉදි කිරීම ආරම්භ කළ අවස්ථාවේ දී නවෝදා ප්‍රජා ජල ව්‍යාපෘතිය විසින් නැවත වරක් ඉල්ලීම කරන ලද්දේ මෙම ළිඳ අඩි 16ක විෂ්කම්භයෙන් යුතු වන බැවින් ගඟ මැද ඉදිකිරීමෙන් නඩත්තු කටයුතු සිදු කිරීම අපහසු වන බවත් එබැවින් මෙම ළිඳ ඉවුර ආසන්නයේ ඉදි කරන ලෙසත්ය.මෙම වෙනස් කිරීම අදාළ ඇස්තමේන්තු සංශෝධනය වන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.
ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතාගේ යොජනාවෙන් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් පෙ.ව.11.10 ට කාරක සභාව ගරු මහ සභාව බවට පත්විය.

- අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා

නැදිගම්විල ප්‍රජා ජල ව්‍යාපෘතිය විසින් ඉල්ලීම පරිදි සිදු කරන ලද වෙනස් කිරීම සඳහා එම ආයතනය වෙතින් ඒ බව ලිඛිතව ලබාගැනීමට කටයුතු කිරීම සුදුසුබවට ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

24. ගරු දකුණු පළාත් ආණ්ඩුකාරවර බන්දුල හරිස්චන්ද්‍ර වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාව

අසනිප තත්වය හේතුවෙන් අභවප්‍රාප්ත වූ ගරු දකුණු පළාත් ආණ්ඩුකාරවර බන්දුල හරිස්චන්ද්‍ර වෙනුවෙන් ශෝක පණිවිඩය මෙම ගරු සභාවට ඉදිරිපත් කරමි.

➢ අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා

අසනීප තත්වය හේතුවෙන් අභාවප්‍රාප්ත වූ ගරු දකුණු පළාත් ආණ්ඩුකාරවර බන්දුල හරිස්චන්ද්‍ර වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන අතර ම එතුමා ආණ්ඩුකාරවරයෙකුගේ ස්වභාවය ඉක්ම වූ ඉතා සුහදශීලී මිනිසෙකු බවත් මෙතුමාගේ වියෝව අපට මහත් පාඩුවක් වන බවත් ප්‍රකාශ කරන ලදි.

➢ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

ආණ්ඩුකාර තනතුර ඉක්වා මනුසත්බවින් යුතු මිනිසෙකු බවත් ඉතාමත් කෙටි කාලයක් තුළ දකුණු පළාතට විශාල කාර්යයභාරයක් සිදු කළ බවත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලෙක්ම ලෙසත් කටයුතු කර ඇති බවත් එවැනි නිල තනතුරු කිහිපයක්ම එතුමන් විසින් දරා ඇති බවත් ප්‍රකාශ කරන ලදි.පළාත් පාලන ආයතන සඳහා විශාල වැඩ කොටසක් කිරීමට දැනුම හා හැකියාව එතුමා සතුව පැවති බවත් එතුමාගේ වියෝව අපට මහත් පාඩුවක් වන බවත් එතුමන්ට නිවන්සුව ප්‍රාර්ථනා කරමින් ශෝකය යෝජනාවක් ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කරන ලදි.

➢ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා

තනතුරට එහා ගිය මනුසත්කමින් යුතු පුද්ගලයකු වූ බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා ඉතාමත් කෙටි කාලයක් තුළ විශාල කාර්යයභාරයක් සිදු කළ බවත් ,සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු වූ මෙතුමා ගුරුවරයෙක් ලෙස කලක් සේවය කර පරිපාලන සේවයේ නිලධාරායෙකු ලෙස කටයුතු කළ කීර්තිමත් රාජ්‍ය නිලධාරියෙක් වන බවත් කලක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලෙක්ම්වරයා ලෙසද කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. එතුමා වෙනුවෙන් , එතුමාගේ පවුලේ සියළුදෙනා වෙත ශෝකය ප්‍රකාශ කරන බව ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

25. ඇමතුම් දින පොත් ලබාදීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් ,කාර්යාල නිලධාරීන්,පෙර පාසල් ගුරුවරුන්, පුස්තකාල කාර්යය මණ්ඩලය සහ වැඩ අධීක්ෂක නිලධාරීන් වෙත ලබාදීම සඳහා ඇමතුම් දින පොත් මිලට ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

26. කාවන්තිස්සපුර පෙර පාසල් ජල සැපයුම සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු මුදල ගෙවීම් කිරීම සඳහා වූ යෝජනාව

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025 යටතේ කාවන්තිස්සපුර පෙර පාසල් ජල සැපයුම සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් ඉදිරිපත් කර ඇති රු.37,751.00 ඇස්තමේන්තු මුදල සභා අරමුදලින් ගෙවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

27. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සේවය කරනු ලබන සෞඛ්‍ය කම්කරුවන් සඳහා පෝෂණ මල්ලක් ලබාදීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සේවය කරනු ලබන සෞඛ්‍ය කම්කරුවන් සඳහා පෝෂණ මල්ලක් ලබාදීම වෙනුවෙන් 2025 වර්ෂය සඳහා පහත වැය විෂයන් යටතේ රු.300,000.00 ක මුදලක් වෙන්කර ඇති බැවින් එකී ප්‍රතිපාදන මගින් සෞඛ්‍ය කම්කරුවන් සඳහා පෝෂණ මල්ලක් ලබාදීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| වැය ශීර්ෂය | මුදල (රු) |
|---|---|
| 207-1 සහනාධාර | 100,000.00 |
| 207-2(1) සෞඛ්‍ය අංශය සඳහා පෝෂණ මල්ලක් ලබාදීම | 200,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.තමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

28.ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමාගේ නිවාඩු අනුමත කිරීම සඳහා වූ යෝජනාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හර්ෂ උදයකුමාර ජයවීර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබලිව්.පී.සුජීවා නිල්මිණී මහත්මිය 20205.11.21 වන දින පැවැත්වෙන නොවැම්බර් මස මාසික මහ සභාව වෙත සහභාගී වීමට නොහැකි බවට දැනුම් දී ඇති බවත් ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම.

➢ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම

2025.11.10 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ කාර්මික සේවා කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම

2025.11.07 වන දින පවත්වන ලද කාර්මික සේවා කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ පරිසර පොදු පහසුකම් කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම

2025.11.10 වන දින පවත්වන ලද පරිසර පොදු පහසුකම් කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.



CamScanner

➢ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම

2025.11.10 වන දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා,වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

I. 2025 ඔක්තෝම්බර් මස ඒකාබද්ධ ලැබීම්

2025 ඔක්තෝම්බර් මස සත්‍ය ආදායම රු.3,888,806.60 ද වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදී.

II. 2025 ඔක්තෝම්බර් මස ඒකාබද්ධ වියදම් සාරාංශය

2025 ඔක්තෝම්බර් මස සත්‍ය වියදම රු.20,101,840.10 ද වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදී.

III. 2025 ඔක්තෝම්බර් මස හිඟ ආදායම් වාර්තාව

2025 ඔක්තෝම්බර් මාසය අදාළ, ආදායම් අය කර ගැනීම සහ හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය අනුව සමස්ත හිඟ මුදල් පහත පරිදි වේ. හිඟ වරිපනම් බදු මුදල රු.2,944,521.31 ක් ද, හිඟ ව්‍යාපාර බදු මුදල රු.335,600.00 ක් ද, හිඟ යන්ත්‍රෝපකරණ කුලී රු.311,400.00 ද,හිඟ ටෙන්ඩර් මුදල් රු.219,784.99 ද,හිඟ කඩ බදු රු.4,296,121.80 ද, හිඟ විනෝද බදු රු.295,940.00 ද,හිඟ ගලිබවුසර ගාස්තු රු.86,414.00 වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදී.

IV. 2025 ඔක්තෝම්බර් 01 දින සිට ඔක්තෝම්බර් 31 දක්වා රු.100,000.00 ඉක්ම වූ ගෙවීම් විස්තරය ඇතුළත් වාර්තාව

| දිනය | වවුචර් අංකය | වවුචර් විස්තරය | ගෙවන ලද ආයතනය/කාටද? | මුදල රු.00 |
|---|---|---|---|---|
| 2025.10.01 | 8 | චක්‍ර ලේඛ ප්‍රකාරව නිල ඇඳුම් හිමි පෙර පාසල් ගුරු නිලධාරීන් සඳහා නිල ඇඳුම් ලබාදීම. | එච්.වී. දයාධර්මසිලි | 109,975.00 |
| 2025.10.01 | 16 | සභාව සතු රථවාහන සඳහා ඉන්ධන මිළට ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | ඉරේෂා පිලිං ස්ටේෂන් පුද්ගලික සමාගම | 526,031.00 |
| 2025.10.02 | 16 | බහුකාර්යය ගොඩනැඟිල්ලේ වහලයේ ඉතිරි කොටස ඉදිකිරීම කාණු පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් වූ ඇප තැන්පතු නිදහස් කිරීම | ලේඛා කන්ස්ට්‍රක්ෂන් | 200,000.00 |
| 2025-10-09 | 36 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව කපළ කටයුතු සඳහා සේවය ලබාගත් දෛනික කාර්ය මණ්ඩලය සඳහා කුලී පදනම මත වැටුප් ගෙවීම. - 2025 සැප්තැම්බර් | ලේකම් - තිප්‍රාස. සභා දෛනික කාර්ය මණ්ඩලය | 295,398.59 |
| 2025.10.10 | 43-1 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ යාන්ත්‍රික වැඩපල සේවය කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. 2025 සැප් | එස්.පී.කේ. හර්ෂණ | 155,950.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 43-11 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ යාන්ත්‍රික වැඩපල සේවය කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. 2025 සැප් | ජී. හර්ෂණ | |
| 2025.10.10 | 44 | 2025 සැප්තැම්බර් මස ස්ථිර හා දෛනික කාර්ය මණ්ඩල අතිකාල දීමනා ගෙවීම. | ලේකම් - තිප්‍රාස. සභා දෛනික හා ස්ථිර කාර්ය මණ්ඩලය | 514,237.00 |
| 2025.10.10 | 45 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව කසළ කටයුතු සඳහා සේවා අවශ්‍යතාවය මත සේවය ලබාගත් තාවකාලික සේවක මහත්ම මහත්මීන් සඳහා කුලී පදනම මත වැටුප් ගෙවීම. - 2025 සැප්තැම්බර් | ලේකම් - තිප්‍රාස. සභා තාවකාලික කාර්ය මණ්ඩලය | 653,400.00 |
| 2025-10-13 | 51 | තට්ටුව සඳහා ටයර් , ටියුබ් හා රිම්ටේප් මිළට ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | දක්ෂිණ ටයර් වර්ක්ස් | 174,320.00 |
| 2025.10.13 | 53 | ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා තීන්ත මිළට ගැනීම වෙනුවෙන් මිළට ගැනීම. | සුරංග හාඩ්වෙයාර් ප්‍රයිවට් ලිමිටඩ් | 320,725.00 |
| 2025.10.16 | 79 | සභාව සතු ආයතන වල විදුලි බිල්පත් පියවීම. | ලංකා විදුලි බල මණ්ඩලය | 113,689.02 |
| 2025.10.16 | 82 | සෞඛ්‍ය අංශයේ සේවක මහත්ම මහත්මීන් සඳහා දිවා ආහාර සැපයීම වෙනුවෙන් බිල්පත් පියවීම. | එල්.එච්.එස්.පී කුමාර | 102,240.00 |
| 2025.10.21 | 85 | සභාව සතු රථවාහන සඳහා ඉන්ධන මිළට ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | ඉරේෂා ෆිලිං ස්ටේෂන් පුද්ගලික සමාගම | 585,479.00 |
| 2025.10.22 | 89 | මහසෙන්පුර ආදාහනාගාරය සඳහා 37.5 kg ගෑස් සිලින්ඩර් 09 ක් මිළට ගැනීම | සෝමසිරි ස්ටෝර්ස් පුද්ගලික සමාගම | 160,316.97 |
| 2025.10.23 | 97 | 2025 සැප්තැම්බර් මස ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම. | ලේකම් - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය | 6,056,111.54 |
| 2025.10.23 | 98 | DS-40 OIL 210 l මිළට ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | වී.කේ. සිරිමාන්න | 229,500.00 |
| | 99 | 2025 ඔක්තොම්බර් මස සභික දීමනා ගෙවීම. | ලේකම් - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා සභික මණ්ඩලය | 345,000.00 |
| 2025.10.29 | 104 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලයට 2025 වර්ෂයට පොත් පත් මිළටගැනීම. | සරසවි පොත්හල පුද්ගලික සමාගම | 112,316.00 |
| | 106 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලයට 2025 වර්ෂයට පොත් පත් මිළටගැනීම. | දයාවංශ ජයකොඩි සහ සමාගම | 116,000.00 |



CamScanner

| | | | | |
|---|---|---|---|---|
| 2025.10.31 | 118 | ZB-0413 කම්පැක්ටර් රථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම. | ඔටෝ බෙස් | 1,603,752.33 |
| 2025.10.31 | 119 | සභාව සතු රථවාහන සඳහා ඉන්ධන මිළට ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | ඉරේෂා ෆිලිං ස්ටේෂන් පුද්ගලික සමාගම | 492,673.00 |
| 2025.10.31 | 156 | ජල බවුසර් සඳහා ජලය සැපයීම 2025 ජුලි මාසය සඳහා බිල්පත් පියවීම. | ජාතික ජල සම්පාදන මණ්ඩලය | 166,026.00 |
| 2025.10.31 | 157 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ආයතන වල ජල බිල්පත් පියවීම. | ජාතික ජල සම්පාදන මණ්ඩලය | 111,455.15 |
| 2025.10.31 | 159 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයට ලැප් ටොප් පරිගනකයක් මිළට ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | මෙට්රෝ කම්පියුටර් ටෙක්නොලොජි | 210,000.00 |
| 2025.10.31 | 160 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයට පරිගනක 08 ක් මිළට ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | BASE HP PVT LTD | 2,276,550.40 |

v. **<u>2025 ඔක්තෝම්බර් 01 සිට 2025 ඔක්තෝම්බර් 31 දින දක්වා සැලසුම් කමිටු අනුමැතිය ලැබී ඇති ගොනු ඇතුළත් වාර්තාව</u>**

| අනු අංකය | ලියාපදිංචි අංකය | නම හා ලිපිනය | අනුමැතිය | කමිටු දිනය |
|---|---|---|---|---|
| 01 | TPS /19/SD/2025/143 | පුබුදු චින්තක අලුත් ගෙදර,39,කොරගහ උල්පත,යෝධකණ්ඩිය | අනුබෙදුම් අනුමත විය. | 2025.10.10 |
| 02 | TPS/19/SD/2025/144 | පුබුදු චින්තක අලුත් ගෙදර,21,කොරගහ උල්පත,යෝධකණ්ඩිය | අනුබෙදුම් අනුමත විය | 2025.10.10 |
| 03 | TPS/19/SD/2025/184 | කේ.ඩී.එච්.ප්‍රසංග අනුරධ ,986/B,ගැමුණුපුර පාර,දෙබරවැව,තිස්සමහාරාම. | අනුබෙදුම් අනුමත විය | 2025.10.10 |
| 04 | TPS/19/SD/2025/185 | ඩී.ඩබ්.බී.එන්.විමලතුංග, මහසෙන්පුර,තිස්සමහාරාම. | අනුබෙදුම් අනුමත විය | 2025.10.10 |
| 05 | TPS/19/SD/2025/186 | කේ.එම්.අනුර ෂෙල්ටන් ,අංක 707/1,සේනපුර,තිස්සමහාරාම. | අනුබෙදුම් අනුමත විය | 2025.10.10 |
| 06 | TPS/19/ SD /2025/188 | කේ.ඒ.පී.පී.දමයන්ති,වරාකනත්ත වත්ත,කච්චේරියගම,තිස්සමහාරාම. | අනුබෙදුම් අනුමත විය | 2025.10.10 |
| 07 | TPS/19/ SD /2025/187 | පී.කේ.ඒ.කුලසේන,අංක 21,කිරිවවුල,ගොඩගන ඉඩම,අන්දරගස්යාය,තිස්සමහාරාම. | අනුබෙදුම් අනුමත විය | 2025.10.10 |
| 08 | TPS/19/ SD /2025/189 | ජේ.අජිත් ප්‍රියන්ත,අංක 541, ගඟසිරිපුර,දෙබරවැව,තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.10.10 |



CamScanner

| | | | | |
|---|---|---|---|---|
| 09 | TPS/19/SD/2025/190 | ජේ.අජිත් ප්‍රියන්ත,අංක 541, ගහසිරිපුර,දෙබරවැව,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.10.10 |
| 10 | TPS/19/SD/2025/191 | එල්.කේ.කමලාවති,අංක 509/2,ගහසිරිපුර,දෙබරවැව,තිස්මහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.10.10 |
| 11 | TPS/19/SD/2025/193 | එම්.එස්.සිරියාවති,අංක 266/4,ශ්‍රියාවාස,පන්නේගමුව,වීරවිල. | අනුබෙදුම අනුමත විය | 2025.10.17 |
| 12 | TPS/19/SD/2025/195 | කේ.එච්.පුෂ්ප තිලාන්,අංක 1207/2,නල මාවත ,විජිතපුර,තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.10.17 |
| 13 | TPS/19/SD/2025/18 | ජී.ජී.නිරාශා සෙව්වන්දි, බෝගහපැලැස්ස, කතරගම පාර,තිස්සමාහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.10.17 |
| 14 | TPS/19/SD/2025/19 | ජී.ජී.නිරාශා සෙව්වන්දි, බෝගහපැලැස්ස, කතරගම පාර,තිස්සමාහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.10.17 |
| 15 | TPS/19/SD/2025/192 | එම්.ඩී.ජගත් රංජන්,අංක 87/A,කච්චේරියගම,තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.10.17 |
| 16 | TPS/19/SD/2025/196 | චමින්ද දිසානායක, කෝනගහවත්ත,පිටපැලැස්ස,මාගම,තිස්ස මහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.10.30 |
| 17 | TPS/19/SD/2025/197 | ලියන ගමගේ සරත්, ගහසිරිගම,ගෝනගමුව,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.10.30 |
| 18 | TPS/19/SD/2025/198 | ලියනගමගේ සිතුමි විමංශන, ගහසිරිගම,ගෝනගමුව,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.10.30 |
| 19 | TPS/19/SD/2025/201 | එම්.එස්.එම්.අලි, කිරින්දගම, කිරින්ද, තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.10.30 |
| 20 | TPS/19/BA/2025/202 | ලක්ෂ්මන් රණමුක,ග්‍රැන්ඩ්යාල හොටෙල්,ගුණවර්ධන මාවත,දෙබරවැව,තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.10.30 |
| 21 | TPS/19/ BA /2025/59 | ඩබ්.පී.රෝෂාන් ජනරංජන,ගුණවර්ධන මාවත,දෙබරවැව,තිස්සමාරාම. | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.10.10 |
| 22 | TPS/19/ BA /2025/68 | ජී.එස්.වයි. ද සිල්වා ,සේනානායක මාවත, හැළඹලස්වල,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.10.10 |
| 23 | TPS/19/ BA /2025/72 | ඩබ්.ආර්.නිශ්ශංක,අංක 69,පළමු පටුමග,මදව්ව,අංජලිගල,තිස්සමාහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.10.17 |
| 24 | TPS/19/ BA /2025/76 | එම්.දයාවති,අංක 255,කාවන්තිස්සපුර, තිස්සමහාරාම. | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.10.17 |
| 25 | TPS/19/ BA /2025/78 | එල්.අයි.අබේනායක,අංක 616,කතරගම | ගොඩනැගිලි | 2025.10.17 |

| | | | | |
|---|---|---|---|---|
| | | පාර,කොහොඹගහපැලැස්ස,තිස්සමහාරාම | සැලසුම් අනුමත විය | |
| 26 | TPS/19/ BA /2025/05 | ඩබ්.ජී.චමිල ප්‍රියශාන්ත,අංක 81,උඩස්ගම,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.10.17 |
| 27 | ත්‍රිපාස/19/සං/අ/2024/105 | සිසිලන් වික්‍රමසූරිය,අංක 324,මැණික් වෙහෙර ඉදිරිපිට,දෙබරවැව,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.10.17 |
| 28 | TPS/19/ BA /2025/79 | බී.එල්.නුවන්,අංක 270/1, සඳගිරිගම,තිස්සමාහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.10.30 |
| 29 | TPS/19/ BA /2025/75 | එම්.පී.ඩී.මධුශානි ද සිල්වා,මුතියම්මා ඇල පාර,මැදවැලැන,දෙබරවැව,තිස්සමහාරාම. | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.10.30 |
| 30 | TPS/19/ BA /2025/77 | එල්.අයි.අබේනායක,අංක 616,කතරගම පාර,කොහොඹගහපැලැස්ස,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.10.30 |
| 31 | TPS/19/ BA/2025/80 | ඩී.පී.එන්.කුරුනේරු,අංක 12, පුංචි අකුරුගොඩ, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.10.30 |
| 32 | TPS/19/ BA /2025/77 | එල්.අයි.අබේනායක,අංක 616,කතරගම පාර,කොහොඹගහපැලැස්ස,තිස්සමහාරාම | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය | 2025.10.30 |
| 33 | TPS/19/ BA /2025/49<br>TPS/19/ COC/2025/28 | ලක්සිරිනි රුචනිකා වීරසිංහ, බංගලාවත්ත,වැලිපොත්වෙල,යෝධක්ණ්ඩිය, තිස්සමහාරාම | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය | 2025.10.30 |
| 34 | TPS/19/ BA /2025/78<br>TPS/19/ COC/2025/29 | එල්.අයි.අබේනායක,අංක 616,කතරගම පාර,කොහොඹගහපැලැස්ස,තිස්සමහාරාම | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය | 2025.10.30 |

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමය යෝජිත අයවැය කෙටුම්පත සභාවට ඉදිරිපත් කළබවත්,ඉදිරි වර්ෂය තුළ දී විශාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාණයක් සිදු කිරීමට අදහස් කරන බවත්, තිස්සමාහාරාම ප්‍රාදේශීය සභාව 2024 වර්ෂයේ පැවැත්වුණ සාහිත්‍ය උත්සවය වෙනුවෙන් කුසලතා සම්මාන සඳහා සුදුසුකම් ලැබුබවත් ඒ සඳහා මහඟු සේවාවක් සිදු කළ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලය වෙත ස්තූතිය පුදුකරන බවත් ප්‍රකාශ කරන ලදි.

(පෙ.ව 11.30 ට ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී එම්.එල්.එම්.අසාර් මහතා සහ ගරු ප්‍රාදේශී සභා මන්ත්‍රී කේ.රත්න මහතා සභා කාර්යාලයෙන් පිටත්ව යන ලදි.)



CamScanner

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමය යෝජිත අයවැය තොවුම්පත ඉදිරියේ දී සාකච්ඡා කිරීම සිදු කරන බවත් ,එමගින් මේතෙක් ගැටළුවක්ව පැවති ප්‍රශ්න රාශියකට පිළිතුරු ලබාගනිමින් විශාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාණයක් සිදු කිරීමට අදහස් කරන බවත්,මේ වන විට වාහන නැවත සකස් කර ඇති බැවින් විශාල කර්මාන්ත ප්‍රමාණයත් සිදු කරමින් පවතින බවත් , තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවිධිමත්ව පවතින පෙර පාසල් යම්කිසි ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීමට කටයුතු කරන බවත් බිම් මට්ටමේ සිට පෙර පාසල් පද්ධතිය ක්‍රමවත් වැඩපිළිවෙළක් යටතේ ක්‍රියාත්මක කිරීමට ගරු අග්‍රාමාත්‍යතුමියගේ ද අදහසක් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.තිස්සමහාරාම නගරයේ කානු පද්ධතිය පිරිසිදු කිරීම සඳහා පවත්වන ලද වැඩසටහන සඳහා සහභාගී වූ සියළුදෙනාට ස්තූතිය පුදකර සිටින බවත් මෙම කාණු පද්ධතිය පිරිසිදුව තබා ගැනීම සඳහා ව්‍යාපාරික ප්‍රජාව මෙන්න ජනතාවද දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම රටම එකට ජාතික මෙහෙයුම කමිටුව පිහිටුවීම සිදු කළ බවත් ඒ අනුව රටම එකට එක්ව ක්‍රියාත්මක කරන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩපිළිවෙළ සඳහා සියළුම රාජ්‍ය ආයතන සමඟ එක්ව කටයුතු කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කරන බවට ප්‍රකාශ කරන ලදී.මෙම සියළුම කාරනා සම්බන්ධයෙන් සියළුදෙනාම නිසි අවබෝධයෙන් හා එකමුතුව කටයුතු කළහොත් මෙම කාර්යයන් සිදු කිරීමට ප්‍රාදේශීය සභාවක් ලෙස ඉදිරිගමනක් යාමට පහසුවන බවත් 2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත අයවැය තුළින් ඉදිරි වර්ෂය තුළ විශාල පියවරක් ලෙස සභාව බල ප්‍රදේශයේ අවශ්‍යතා වෙනුවෙන් මැදිහත්ව එකට එක්ව සහයෝගයෙන් කටයුතු කිරිම සිදු කළයුතු බවත් , තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව අනෙකුත් සභා වලින් සුවිශේෂී සභාවක් බවට පත් කර ගැනීමට සියළුමදෙනාම සහෝදරත්වයෙන් එකමුතු වී කටයුතු කිරීම අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, ලේකම්තුමියටත්,ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ස්තූතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව.12.00 ට පමණ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ආර්.එම්.චතුරානි වැලිවිහාරේ,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

එච්. එල්. ජයසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
තිස්සමහාරාම.

එච්.එල්.ජයසිරි,
සභාපති,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 21 වන දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.



CamScanner